චක්‍රලේඛ අංකය -01/2025

මගේ අංකය -සමු/අධි/CCD/01
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව(බ.ප)
ආදිපාද වීදිය,
කොළඹ .01
2025.03. 21

බස්නාහිර පළාතේ සියලුම සමුපකාර සමිති වල සභාපතිවරුන් වෙත.

<u>මැතිවරණ කටයුතු සදහා සමුපකාර සමිතිවල දේපල හා වත්කම් භාවිතා කිරීමෙන් වැළකීම.</u>
<u>පළාත් පාලන ආයතන ඡන්ද විමසීම.</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් මැතිවරණ කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛ අංක-LAE/2025/06 දරණ හා 2025.03.03 දිනැතිව නිකුත් කර ඇති රජයට සහ රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලට අයත් දේපල මැතිවරණ කාල සීමාව තුළදී අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වීම සහ නිලධාරින්, සේවකයන් බඳවා ගැනීම/ උසස් කිරීම/මාරු කිරීම සීමා කිරීම- පළාත් පාලන ආයතන ඡන්ද විමසීම-2025 හිසින් යුතු නියෝග බස්නාහිර පළාතේ ලියාපදිංචි සියලු සමුපකාර සමිති සඳහාද අදාල කරමි.

02. එයට අමතරව පහත සදහන් උපදෙස් හා නියෝග පිළිබඳව ඔබගේ විශේෂ අවධානය යොමු කරවන අතර එම උපදෙස් හා නියෝගවලට අදාල කටයුතු කලයුතු බව වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

- පළාත් පාලන ආයතන ඡන්ද විමසීම පැවැත්වෙන කාලසීමාව තුල සමුපකාර සමිතිවලට අයත් යම් චංචල හෝ නිශ්චල දේපලක් ,ඡන්ද අපේක්ෂකයෙකු හෝ යම් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ තෝරාපත් ගැනිම , ප්‍රවර්ධනය කිරිම හෝ වළක්වාලීමේ කාර්යය සදහා භාවිතා කිරිමෙන් වලකින ලෙස මෙයින් දන්වමි.

- එසේම සමුපකාර සමිති පරිශ්‍රය, සමිතිය සතු ගොඩනැගිලි ,ඉඩම හා ව්‍යාපාරික ස්ථාන ඇතුළු නිශ්චල හා චංචල දේපල භාවිතා කරමින් ඡන්ද ප්‍රචාරණ කටයුතු සිදු කිරිම හෝ ඡන්ද ප්‍රචාරණ කටයුතු වලට අදාල වන බැනර්,පෝස්ටර් යනාදිය ප්‍රදර්ශනය කිරිම හෝ නොකල යුතු බව අවධාරණය කරමි.

- මෙම උපදෙස් උල්ලංඝනය කරන අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයන් හා නිලධාරින් සම්බන්ධයෙන් සමුපකාර ප්‍රඥප්තියේ නෛතික විධිවිධාන අනුව කටයුතු කිරිමට සිදුවන බවත් යම් සමිතියක පාලක මණ්ඩලයක් ක්‍රියාත්මක වන පසුබිමක් තුල මෙම උපදෙස් උල්ලංඝනය විමක් සිදු වුවහොත් අදාල පාලක මණ්ඩල සමාජිකයන් ධුරවලින් ඉවත් කිරිමට සිදුවන බවත් දන්වමි.

එම්.ජේ.පි. ජයකොඩි
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්
බස්නාහිර පළාත.

පිටපත්
01.මැතිවරණ කොමසාරිස් ජනරාල්- මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය - කරු.දැ.පි.
02.තේරීම්භාර නිලධාරි (කොළඹ/කළුතර/ගම්පහ) - කරු.දැ.පි.
03.ආණ්ඩුකාර ලේකම්- බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය - කරු.දැ.පි.
04.ජේෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (බස්නාහිර පළාත) -කරු.දැ.පි.
05.ලේකම්-සමුපකාර හා ප්‍රවාහන අමාත්‍යාංශය (බස්නාහිර පළාත) - කරු.දැ.පි.
06.සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්(කොළඹ/කළුතර/ගම්පහ) - කරු.දැ.පි.හා අ.ක.ස.